# පළාත් සභා නිවේදන

මගේ අංකය : මපස/ඒ/12/90 (v).

## මධ්‍යම පළාත් සභාව

මතු දැක්වෙන ප්‍රඥප්තිය 1991 මාර්තු මස 26 වැනි දින පැවති මධ්‍යම පළාත් සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත වූ අතර, එයට අංක ජීසීපී/ඒඑස්/03 හා 1991 ජුනි මස 25 වැනි දින දරන ලිපියෙන්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1992 ක් වූ ජූලි මස 17 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 92,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

## 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය 9 වැනි ලැයිස්තුවේ 04 - (1), (2), (3), (4) යටතේ මධ්‍යම පළාතේ පළාත් සභා බල ප්‍රදේශය තුළ සංස්ථාපනය වූ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශාංගික සියළු කරුණු සඳහා ද මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන (පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂනය කිරීමේ බලතල පැවරීම) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වේ.

අකාර්යක්ෂමතාවය උඩ පළාත් පාලන ආයතන විසුරුවා හැරීම පිළිබඳ ඇමතිවරයාගේ බලතල.

2. (1) යම් පළාත් පාලන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධයෙන් හෝ සභිකයින් අතුරෙන් කිසිවෙකු සම්බන්ධයෙන් -

(අ) අකාර්යක්ෂමතාවය සහ නොමනා පාලනය ; හෝ
(ආ) අදාල පනතින් හෝ වෙනයම් ලිඛිත නීතියකින් පැවරී ඇති කාර්යයන් කිරීමෙහිලා නිරන්තර පැහැර හැරීම ; හෝ
(ඇ) නීතියේ සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට නිරතුරුවම ප්‍රතික්ෂේප කිරීම සහ නොසලකා හැරීම ; හෝ
(ඈ) අදාල නීතියෙන් හෝ වෙනයම් ලිඛිත නීතියකින් පැවරෙන බලතල අනිසි ලෙස පාවිච්චි කිරීම ; හෝ
(ඉ) යම් පළාත් පාලන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා ; හෝ යම් සාමාජිකයෙකු රැස්වීම් පැවැත්වීම, රැස්වීම්වලට පැමිණ සිටීම, පවත්වන ලද රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීම, රැස්වීමේ කටයුතු කිරීම, හෝ නිරතුරුවම ප්‍රතික්ෂේප කිරීම

පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට කවර වූ හෝ අවස්ථාවක පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා සෑහීමකට පත්වන්නේ නම් ඒ එක් එක් අවස්ථාවේ අවස්ථාගත කරුණු අනුව, අවශ්‍ය වන පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් -

(i) එවැනි පළාත් පාලන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා ධුරයෙන් ඉවත් කළ හැකිය.
(ii) සාමාජිකයින් සියළු දෙනාම හෝ යම් සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. තවද එවැනි සෑම නිගමනයන්ම හැකිතාක් ඉක්මනින් පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.
(iii) පළාත් පාලන ආයතනය විසුරුවා හරිනු ලැබිය හැකිය. තවද, එවැනි සෑම නියමයක්ම හැකිතාක් ඉක්මනින් පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් (1) වැනි උප වගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර (1) වැනි උප වගන්තියේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමකට පත්වනු පිණිස ඒ කාරණය ගැන මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂාකොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරියෙකු පත්කළ යුතු අතර, එම නිලධාරියාට එම පරීක්ෂණයට අදාලව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක බලතල තිබිය යුතුය.

(3) (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් (2) වැනි උප වගන්තිය යටතේ විශ්‍රාමලත් අධිකරණ නිලධාරියෙකු පත් කරන විටක, එක් එක් අවස්ථාවේ තත්ත්වයන් අනුව අවශ්‍ය විය හැකි පරිදි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් -

(i) අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ ධුරය දැරීම අත්හිටුවා නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ උප සභාපතිවරයාට හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ තනතුර පුරප්පාඩු වී ඇති අවස්ථාවක දී හෝ ධුරය අත්හිටුවන ලද අවස්ථාවක නාගරික කොමසාරිස්වරයාට හෝ යම් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයෙකුට නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, ඔහුගේ කාර්යයන් ඉටුකිරීමටත් අවස්ථාවෝචිත පරිදි විධානය කරනු ලැබිය හැකිය ; නැතහොත්,

(ii) සභිකයින් අතුරින් යම් සභිකයෙකු අත්හිටුවිය හැකිය ; නැතහොත්

(iii) පළාත් පාලන ආයතනය අත්හිටුවා, අවස්ථාවෝචිත පරිදි එම පළාත් පාලන ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්යයන් ඉටුකිරීමටත්, නාගරික කොමසාරිස්වරයාට හෝ යම් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයෙකුට විධාන කරනු ලැබිය හැකිය ; නැතහොත්

(ආ) (2) වැනි උප වගන්තිය යටතේ පත්කරනු ලැබූ තැනැත්තාගේ වාර්තාව ලැබූ පසු අමාත්‍යවරයා විසින් (1) වැනි උප වගන්තිය යටතේ නියමයන් කරනු ලැබිය හැකිය. නැතහොත් මෙම වගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලැබූ නියමය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකිය.

(ඇ) අමාත්‍යවරයා විසින් මහ නගර සභාවක නගරාධිපතිවරයා හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබූ විටෙක ඒ නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ සභික ධුරය ද අවසන් වන අතර, එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධි විධාන අදාල වන්නේය.

(4) මහ නගර සභාවක් හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හැරීමෙන් පසුව කවර හෝ අවස්ථාවක දී විසුරුවා හරින ලද මහ නගර සභාවක් වෙනුවෙන් මහ නගර සභා ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව අළුත් මහ නගර සභාවක් හෝ විසුරුවා හරින ලද යම් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් එකී පළාත් පාලන ආයතනයට අදාළ නීතියේ විධි විධානවලට අනුකූලව අළුත් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කළ යුතුයයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය.

(5) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයකම එම නියමය බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වියහැකි විධාන ඇතුළත් විය යුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ විට එයට නීතියේ බලය ඇති විය යුතුය.

(6) මහ නගර සභාවක් හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හරිනු ලැබීමෙන් පසුව ඒ මහ නගර සභාව හෝ පළාත් පාලන ආයතනය සඳහා අළුත් මහ නගර සභාවක් හෝ අළුත් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කළ අවස්ථාවක මහ නගර සභා ආඥාපනතින් හෝ පළාත් පාලන ආයතනයකට අදාල ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් ඒ මහ නගර සභාව හෝ පළාත් පාලන ආයතනය වෙත පිරි නැමුණු, නියම් කෙරුනු හෝ පැවරුනු අයිතිවාසිකම් වරප්‍රසාද බලතල, කාර්ය සහ කර්තව්‍ය අළුත් මහ නගර සභාව හෝ පළාත් පාලන ආයතනය සංස්ථාපනය කරනු ලැබීමට පෙරාතුව ක්‍රියාවෙහි යෙදවූ ඉටුකළ සහ සිදු කළ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ අනුප්‍රාප්තිකයා අළුත් මහ නගර සභාව හෝ අළුත් පළාත් පාලන ආයතනය විය යුතුය.

(7) මේ ප්‍රඥප්තියෙහි - අර්ථ නිරූපනය

"ප්‍රධාන විධායක නිලධාරියා" යන්නෙන් යම් මහ නගර සභාවක නගරාධිපතිවරයා ද යම් නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ද අදහස් වේ.

08-459

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.